# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**7 ශ්‍රේණිය** | **ඉතිහාසය**

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 2 යි

### I කොටස

- **පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01) සෙල්ලිපිවල හේන් හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?
1) සේන් 2) පිටබිම් 3) නවදැලිහේන 4) කනත්ත

02) අතීතයේ වෙළඳ සංවිධාන හඳුන්වා ඇත්තේ
1) ශ්‍රේණි නමිනි 2) පූග නමිනි 3) නිගම 4) සමාගම්

03) දියණිවරුන් සූප ශාස්ත්‍රයේ දක්ෂයන් කිරීම දෙමාපියන්ගේ වගකීමක් බව සඳහන් වන මූලාශ්‍රයකි.
1) සද්ධර්මරත්නාකාරය 2) සීහලවත්ථු
3) මහාවංශය 4) සාහස්සවත්ථුපකරණය

04) අතීතයේ රත්‍රං නිෂ්පාදන සිදුකළ කර්මාන්තය හඳුන්වනු ලැබුයේ
1) මණිකර 2) පෙහෙකාර 3) ස්වර්ණකාර 4) තඹකර

05) වසභ රජු - ධාතුසේන රජු - II සේන රජු අයත්වන රාජ වංශ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1) මෞර්ය - ලම්භකර්ණ - මානවම්ම 2) මානවම්ම - මෞර්ය - ලම්භකර්ණ
3) මෞර්ය - ලම්භකර්ණ - නායක්කර් 4) ලම්භකර්ණ - මෞර්ය - මානවම්ම

06) පනාකඩුව තඹ සන්නයේ සඳහන් වන කිත්ත කුමරුට රැකවරණය ලබා දුන් සෙන්පතියා කවුරුන්ද?
1) ලංකාපුර 2) නගරගිරිකිත්ත
3) දේවපතිරාජ 4) බුද්ධරාජ (බුදල්නා)

07) රුවන්වැලි සෑය අලංකාර කිරීමට රෝමයෙන් රතු පබළු ගෙන්වා ගත් අනුරාධපුර යුගයේ රජතුමා කවුද?
1) භාතිකාභය රජු 2) I සේන රජු
3) විජයබාහු රජු 4) දේවානම්පියතිස්ස රජු

08) සංගමු විහාර ලිපියෙහි දැක්වෙන්නේ කවර රජුන් අතර ඇති වූ ගිවිසුමක් ද?
1) පරාක්‍රමබාහු - නිශ්ශංකමල්ල 2) පරාක්‍රමබාහු - II ගජබාහු
3) පරාක්‍රමබාහු - ත්වගග 4) I විජයබාහු - I පරාක්‍රමබාහු

09) වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක් වන්නේ
1) බලංගොඩ 2) අනුරාධපුරය 3) අම්බලන්ගොඩ 4) හම්බන්තොට

10) අනුරාධපුර රාජධානියේ සිටි අවසාන පාලකයා වන්නේ
1) I උදය රජු 2) I සේන රජු 3) ධාතුසේන රජු 4) V මිහිඳු රජු

- **පහත සඳහන් වාක්‍ය හරි නම් (√) වැරදි නම් (X) ලකුණක් යොදන්න.**

11) සාලිය යනු ඇල් වී වලට කියන තවත් නමකි. ( )

12) පොළොන්නරුවේ උත්තරාරාමය ඉදිකරනු ලැබුයේ නිශ්ශංකමල්ල රජු විසිනි. ( )

13) බුලත් අතක් දී වැඩිහිටියන්ට වැඳීම යන සිරිත් විරිත් අයත් වනුයේ ස්පෘශ්‍ය උරුමයටය. ( )

14) ජාත ක්‍රම උපතේදී සිදුකළ යුතු සිරිත් විරිත් ලෙස හැඳින්වේ. ( )

15) ලාක්ෂා කර්මාන්තය සිදුකරනු ලබන්නේ කැප්පෙටිය ශාකයේ වසන කෘමියාගේ යුෂ වලිනි. ( )

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත්ම ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

16) ................................ පල්ලව රාජ්‍යයේ අගනුවර විය.

17) මානවම්ම පෙළපතේ මූල්‍ය කළමණාකරණය පිළිබඳ ................................ ඉතා හොඳ සාක්ෂි සපයයි.

18) ලෝක සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමේ කාර්යයේ ප්‍රධානත්වය ගනු ලැබුයේ ................................

19) II පරාක්‍රමබාහු රජතුමා විසින් නිර්මාණය කරන ලද කෘතියක් වන්නේ ................................

20) පැරැන්නන් කිරි ලබා ගන්නා ගවයා හඳුන්වනු ලබන නාමය වන්නේ ................................

**(මිහින්තලා පුවරු ලිපිය / සාංචිපුර / චෝල දේශය / කිරිගෙරි / යුනෙස්කෝව / කව්සිළුමිණ / තවලම)**


## II කොටස

<u>**සැළකිය යුතුය.**</u>

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 4ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5 කි.**

01)A හා B දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) A රූපය



i. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. මෙය සොයාගන්නා ලද්දේ කිනම් කාලයකද?

iii. මෙහි සඳහන් වන තොරතුරු ඇතුළත්වන පොළොන්නරු යුගයේ රජු කවුරුන්ද?

iv. මෙහි සඳහන් වන පරිදි රජුට රැකවරණය ලබා දුන් සෙන්පතියා කවුරුන්ද?

(ආ) B රූපය



i. B රූපයෙන් දැක්වෙන්නේ කුමන ස්ථානයද?

ii. මෙම ස්ථානය නිර්මාණය කළ රජතුමා කවුද?

iii. මෙම ස්ථානයෙන් හමුවන වෙනත් පෞරාණික නිර්මාණ මොනවාද?

iv. මෙම ස්ථානය ලෝකයාට සුවිශේෂවන්නේ කුමන හේතුවක් නිසාද?

02)

i. අතීත කෘෂිකර්මාන්තයේ ප්‍රධාන කන්න දෙක නම් කරන්න. (ල 2)

ii. කුඹුරු ගොවිතැනේදී ගොයම කෘමීන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා අනුගමන කළ සාම්ප්‍රදායික ක්‍රම හතරක් ලියන්න. (ල 4)

iii. හේනක් සකස් කර ගන්නා ආකාරය සහ හේනේ වගාකළ භෝග වර්ග මොනවාදැයි පහත කරුණු දෙක විස්තර කර ලියන්න. (ල 5)

a) හේන සකස්කළ ආකාරය　　b) හේනේ වගාකළ භෝග වර්ග

03)

i. අතීතයේ වෙළඳාම දියුණුව පැවති පැරණි වෙළඳ නගර දෙක සඳහන් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට අපනයනය කළ භාණ්ඩ දෙක සහ විදේශ රටවලින් ශ්‍රී ලංකාවට ආනයනය කළ භාණ්ඩ දෙකක් වෙන වෙනම ලියන්න. (ල 4)

iii. IV වන උදය රජුගේ බදුලු ටැම් ලිපියේ සඳහන් නීති තුනක් ලියා දක්වන්න. (ල 5)

04)

i. ලෝක උරුම අතරට එක් වූ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම දෙකක් නම් කරන්න. (ල 2)

ii. අතීත සමාජයේ පැවති උත්සව හා සම්බන්ධ පහත සඳහන් වචන හඳුන්වන්න. (ල 4)

a) ජාත කර්ම　　b) නාමකරණ

c) විද්‍යාරම්භ　　d) කර්ණවේදන

iii. ශ්‍රී ලංකාවේ පවතින ලෝක උරුම අතරින් ඔබ කැමති එක් ස්ථානයක් පිළිබඳ කෙට සටහනක් ලියන්න. (ල 5)

05)

i. අනුරාධපුර යුගයේ රජකම උරුම වූ ආකාර දෙකක් නම් කරන්න. (ල 2)

ii. අනුරාධපුර යුගයේ පාලකයන් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී විශේෂ සැළකිල්ලක් දක්වූ කරුණු හතර දක්වන්න. (ල 4)

iii. අනුරාධපුර රාජධානියේ පාලන කටයුතු මෙහෙයවූ රාජවංශ තුනක් නම් කර එක් උදහරණය බැගින් ඉදිරියෙන් ලියන්න. (ල 5)

06)

i. ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කළ දකුණු ඉන්දීය රාජ්‍ය තුනක් නම් කරන්න. (ල 2)

ii. පොළොන්නරු රාජධානියේ බලය ලබා ගැනීමේ දී නිශ්ශංක මල්ල රජු මුහුණ දුන් අභියෝග හතරක් ලියන්න. (ල 4)

iii. I පරාක්‍රමබාහු රජු ආර්ථිකයට හා සාහිත්‍යයේ උන්නතියට ගත් ක්‍රියාමාර්ග දෙක බැගින් ලියන්න. (ල 5)

07)

i. කාලිංග මාඝ ආක්‍රමණය හමුවේ නිරිත දිග ප්‍රදේශවල බලකොටු පිහිට වූ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)

ii. දඹදෙණිය රජකම් කළ II පරාක්‍රමබාහු රජුගේ සේවාවන් තුනක් ලියන්න. (ල 4)

iii. කුරුණෑගල යුගයේ ශ්‍රේෂ්ඨතම පාලකයා කවුද? එතුමා කළ සේවාවන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)